## කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය - 2014

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අංක 68/11 සහ 1979 දෙසැම්බර් 26 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත නියමාවලියේ 20 වන වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය, 108 සහ 111 වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හා 92 වගන්තිය ප්‍රකාර තවදුරටත් ප්‍රයෝජනයට ගනු ලබන නමුත් ක්ෂය කිරීමෙන් ශුන්‍ය අගයට පත්ව ඇති පිරිවැය රු. 88,136,603 ක් වූ වත්කම් ප්‍රත්‍යාගණනය කර අගය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.2 ගිණුම්කරණ අඩුපාඩු**

කාර්යාල උපකරණ යටතේ ගිණුම්ගත කර තිබූ රු. 2,800,000 ක පරිගණක තොරතුරු පද්ධතිය අස්පෘශ්‍ය වත්කමක් ලෙස ගිණුම්ගත කර, ක්‍රමක්ෂය ලෙස කපා හැරීම ආයතනයේ ප්‍රතිපත්තිය වුවද, එයට අනුකූලව කටයුතු කර නොතිබුණි.

**2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම**

සමාලෝචිත වර්ෂයේ එකතුව රු. 27,159,533 ක් වූ ගිණුම් විෂයයන් 04 ක ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂිය |
|---|---|---|
| | රු. | |
| උපචිත වියදම් | 1,094,418 | උපලේඛන |
| ලැබිය යුතු පාඨමාලා ගාස්තු | 1,188,468 | උපලේඛන හා ශේෂ සනාථ |
| ඉදිරියට ලද පාඨමාලා ගාස්තු | 24,114,499 | - එම - |
| නිලධාරීන් 05 දෙනෙකු සඳහා පර්යේෂණ දීමනා ගෙවීම | 762,148 | අනුමත පර්යේෂණ යෝජනා |
| | 27,159,533 | |

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

1974 සිට 2004 කාලපරාසය තුළ ශිෂ්‍යයින් විසින් විද්‍යා තැන්පතු හා පුස්තකාල තැන්පතු ලෙස ගෙවා තිබූ රු. 280,010 ක් නිදහස් කිරීමට හෝ ආයතනයේ ආදායමට ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

**2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් නීති, රීතිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1974 අංක 02 දරන කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ (i) 14 ඡේදය | අධ්‍යයන කමිටුවල සංයුතිය ආයතනයේ අධ්‍යක්ෂවරයා ඇතුළු සාමාජික සංඛ්‍යාව 09 කින් සමන්විත විය යුතු නමුත්, අධ්‍යයන කමිටුවල සාමාජිකයින් සහභාගීවීම සතුටුදායක තත්ත්වයේ නොපවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. |
| | (ii) 14 (7) උපඡේදය | වසරක් සඳහා අඩුම තරමින් රැස්වීම් වාර 06 ක් අධ්‍යයන මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී කෘෂිකර්ම ආර්ථික විද්‍යා අධ්‍යයන කමිටුවේ සහ ආහාර විද්‍යා හා තාක්ෂණික මධ්‍යස්ථාන කමිටුවේ රැස්වීම් පවත්වා තිබුණේ වාර 05 බැගිනි. |
| (ආ) | 1958 අංක 15 දරන සේවක අර්ථසාධක පනත හා 2001 අගෝස්තු 24 දිනැති අංක ප්‍ර/ආයතන/11 දරන කම්කරු කොමසාරිස්ගේ ලිපිය | අධ්‍යයන දීමනා ජීවන වියදම් දීමනාවක් ලෙස නිර්වචනය නොවන බැවින්, මෙම දීමනාව සේවක අර්ථසාධක අරමුදලට, විශ්‍රාම වැටුප් අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් දායකත්වයට අදාල කර නොගත යුතු වුවත්, ඊට අනුකූල නොවන පරිදි කටයුතු කිරීම හේතුවෙන් ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් ඉහත අරමුදල්වලට රු.61,940 ක් දායක මුදල් වැඩිපුර ගෙවා තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 28.5 වගන්තිය හා 28.6 වගන්තිය | ගමන අවසන් කොට දින 30 ක් ඇතුළතදී ගමන් වියදම් ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළයුතු අතර, ප්‍රමාද වී ඉදිරිපත් කරන ලද ගමන් වියදම් ඉල්ලුම්පත්‍ර සඳහා 28.6 වගන්තිය ප්‍රකාර ප්‍රමාද ගාස්තු අයකළ යුතු වුවත්, නියැදි පරීක්ෂාවන්ට අනුව අවස්ථා 10 කදී ප්‍රමාද වී ඉදිරිපත් කර තිබූ ගමන් වියදම් ඉල්ලුම්පත් වලින් රු. 18,726 ක ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. |
| (ඈ) | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ I කොටසේ VII පරිච්ඡේදයේ 4.1 ඡේදය හා II කොටසේ IX පරිච්ඡේදය | සාමාන්‍ය කාර්යභාරයෙන් පරිබාහිර කටයුත්තක් වන තොග සමීක්ෂණ කටයුතු සාමාන්‍ය රාජකාරී වේලාවෙන් බැහැරව සිදුකරනවානම් අතිකාල හෝ |

| | |
|---|---|
| | නිවාඩු දින වැටුප් පමණක් ගෙවිය හැකි වුවත්, එම විධිවිධානයන්ට අනුකූල නොවන පරිදි සමාලෝචිත වර්ෂයේ ජනවාරි මාසයේදී සාමාන්‍ය රාජකාරී කාලයන්හි නිමකර තිබූ 2013 වර්ෂයේ තොග සමීක්ෂණ කටයුතු වෙනුවෙන් සමීක්ෂණ මණ්ඩලයේ නිලධාරීන් 06 දෙනෙකුට එකතුව රු.79,090 ක තොග සමීක්ෂණ දීමනාවක් ගෙවා තිබුණි. |
| (ඉ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ II කොටස | |
| (i) VIII පරිච්ඡේදයේ 6.2 හි (ii) හා (iii) | තම රාජකාරියට අමතරව කරන සේවාවකින් උපයාගන්නා ගාස්තු ප්‍රමාණයෙන් සියයට 10 ක කොටසක් තමන් අයිති උසස් අධ්‍යාපන ආයතනයට ගෙවිය යුතු වුවද, ආයතනයේ සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද රු.13,169,959 ක බාහිර දේශන ගාස්තු වලින් රු.1,316,996 ක් ආයතන අරමුදලට බැර කර නොතිබුණි. |
| (ii) IX පරිච්ඡේදයේ 2 හි 2.2 | අතිකාල දීමනා ගෙවිය හැක්කේ නිශ්චිත වශයෙන් නියම කරන ලද්දා වූ සාමාන්‍ය වැඩ කටයුතු වලින් ඒකාන්තයෙන් පරිබාහිර වූද, හදිසි වූද, සාමාන්‍ය කාර්යාල වේලාව තුළ කළ නොහැකිවූද වැඩ සඳහා පමණක් වුවත්, ආයතනයේ සේවයේ නියුතු නිලධාරීන්ට රාජකාරී පැවරුම්හි සඳහන් කටයුතු සඳහා අතිකාල වශයෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. 2,094,403 ක් ගෙවා තිබුණි. |
| (ඊ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 371 | තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදිය යුත්තේ අදාල කාර්යය සඳහා ප්‍රමාණාත්මක අග්‍රිමයක් වුවත්, අවස්ථාවන් 11 කදී වියදම් පියවීමට අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩිපුර රු.69,658 ක අත්තිකාරම් ලබා දී තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371 (2) | තත්කාර්ය අතුරු අග්‍රිමයක් එය දෙන ලද කාර්ය නිමකළ විගසම පියවිය යුතු වුවත්, එකතුව රු.95,000 ක අත්තිකාරම් මාස 01 සිට මාස 11 ක කාල ප්‍රමාදයකින් පියවා තිබුණි. |
| (උ) 2010 සැප්තැම්බර් 01 දිනැති අංක 446 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ කාණ්ඩ අංක V | අමාත්‍යාංශ ලේකම්ගේ විධිමත් අනුමැතියක් නොමැතිව පෞද්ගලික සහකාරවරියට දුරකථන වියදම් රු.20,781 ක් සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිපූර්ණය කර තිබුණි. |
| (ඌ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 09 ඡේදය | මානව සම්පත් අයවැය ලේඛණයක් පිළියෙල කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (එ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය 02,03,04,05,06 වගන්ති | පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කළයුතු වුවද, රු. 18,755,469 ක පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් එවැනි ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1528(A) හා 2014 ජුලි 01 දිනැති ලිපිය පදනම් කරගෙන සකස් කරන ලද 2014 ජුලි මස 17 දිනැති අංක 07/2014 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ජුලි සිට දෙසැම්බර් දක්වා කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ නිලධාරීන් 45 දෙනෙකු වෙනුවෙන් දීමනා වශයෙන් රු.1,186,537 ක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.

(ආ) 2014 - 2017 වර්ෂ සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීම සඳහා ආචාර්යවරයෙකුට විධිමත් අනුමැතියක් නොමැතිව රු.150,000 ක ගෞරවාන්විත දීමනාවක් ගෙවා තිබුණි.

(ඇ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 02 ඡේදය සහ 2003 ජනවාරි 29 දිනැති අංක PE 1/174 11-2003 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය යන චක්‍රලේඛවල විධිවිධාන ප්‍රකාර විශ්වවිද්‍යාලය තුළ පවතින මධ්‍යස්ථානවල කටයුතු කිරීම සඳහා විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට ගෙවීමේදී අමාත්‍ය මණ්ඩලයේ හා භාණ්ඩාගාරයේ අනුමැතිය නොලබා කෙටිකාලීන පාඨමාලා සම්බන්ධීකරණ කටයුතු කිරීම සඳහා දීමනා, දේශන ගාස්තු හා සහායකයින්ට ගෙවීම සඳහා ගාස්තු වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.674,406 ක් ගෙවා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 41,865,313 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.34,250,533 ක් වුයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,614,780 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව පෞද්ගලික පඩිනඩි හා වේතන, අනෙකුත් පුනරාවර්තන වියදම් සහ බොල් ණය සහ අඩමාන ණය වෙන් කිරීම පිළිවෙලින් රු. 7,350,852, රු. 2,488,056 ක සහ රු. 2,872,912 කින් වියදමේ වැඩිවීමට වඩා වැඩි වේගයකින් අභ්‍යන්තර ඉපැයීම් හා රජයේ ආධාර මත ක්‍රමක්ෂය පිළිවෙලින් රු. 24,311,860 කින් සහ රු. 2,333,639 කින් වැඩිවීම වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1995 වර්ෂයේ පුස්තකාල පොත් සත්‍යාපනය කිරීමේදී හඳුනා නොගත් රු.280,255 ක් වටිනා පොත් 437 ක් සම්බන්ධයෙන් සහ සමාලෝචිත වර්ෂයේ පුස්තකාල පොත් සත්‍යාපනයේදී මහඉලුප්පල්ලම පුස්තකාලයේ හඳුනා නොගත් පොත් 68 ක් සම්බන්ධයෙන් කිසිදු පියවරක් විගණන දින වන විටත් ගෙන නොතිබුණි.

(ආ) කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සුභ සාධක ආපනශාලාව පවත්වාගෙන යාම වෙනුවෙන් අයකරන ගාස්තු සහ ජල හා විදුලි ගාස්තු කාලීනව සිදුවන වෙනස්කම් අනුව, යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.

**4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

2014 වර්ෂයේදී පාඨමාලා 07 ක් සඳහා ශිෂ්‍යයින් බඳවාගැනීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

**4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

තොග සමීක්ෂණ වාර්තාව අනුව වටිනාකම රු.391,249 ක් වූ චලනය නොවන තොග හා රු. 36,218 ක් වූ සෙමින් චලනය වන තොග හඳුනා ගෙන තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් විගණන දින වන විටත් ගෙන නොතිබුණි.

**4.4 හඳුනාගන්නා ලද පාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පූර්ණ රක්ෂණ ආවරණය යටතේ රක්ෂණය කර තිබූ වටිනාකම රු. 800,000 ක් වූ වෑන්රථයක් අනතුරට පත් වී තිබුණද, එයට අදාළ හානි වටිනාකම් විගණන දිනය වූ 2015 පෙබරවාරි 20 වන දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී රු. 358,456 ක් වටිනා පුස්තකාල පොත් 346 ක් අස්ථානගත වී ඇති බව අනාවරණය කර තිබුණු නමුත්, ඒ සඳහා වගකිවයුතු පාර්ශවයන් නිශ්චය කර අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 18 ක් වුවත්, සේවයේ නියුක්තව ඇත්තේ රියදුරු සහ කම්කරු ශ්‍රේණිවල සේවකයන් 06 දෙනෙකු පමණි. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 10 ක් ඇතුළුව තනතුරු 12 ක් දීර්ඝ කාලයක සිට පුරප්පාඩු වී පවතින අතර, එම පුරප්පාඩු තනතුරු පිරවීමට විගණන දිනය වන විටත් කටයුතු කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය පරිදි වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර එම සැලැස්ම වාර්ෂිකව යාවත්කාලීන කර කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබාගෙන සෑම වර්ෂයක් ආරම්භවීමට අවම වශයෙන් දින 15 කට පෙර විගණකාධිපති, භාණ්ඩාගාරය, රේඛීය අමාත්‍යාංශය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව යන අය වෙත

යොමු කළයුතු වුවද, සමාලෝචිත වර්ෂයේ සංයුක්ත සැලැස්ම සඳහා කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන තිබුණේ 2015 ජනවාරි 31 දින දීය.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

සංයුක්ත සැලැස්මේ ඇතුළත් අරමුණු ඉටුකර ගැනීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද, ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් අරමුණු ඉටු කර ගැනීමේ ප්‍රගතිය කාලානුරූපව පරීක්ෂා කිරීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

**5.3 අභ්‍යන්තර විගණනය**

ආයතනයේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබූ අතර, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් අභ්‍යන්තර විගණන කටයුතු මෙහෙයවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2009 ජූනි 09 දිනැති අංක DMA/2009(1) දරන මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව, පිළියෙල කළයුතු කාර්තුමය වාර්තා හා වාර්ෂික වාර්තා නියමිත දින වකවානුවලදී පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණන වැඩසටහනක් පිළියෙල කර තිබුණි. ඒ අනුව වර්ෂය තුළ පරීක්ෂා කළයුතු සියළුම අංශයන් පරීක්ෂාවට ලක්කර නොතිබුණු අතර, කරන ලද පරීක්ෂාවන් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන වාර්තා 02 ක් පමණක් ඉදිරිපත් කර තිබුණි.

**5.4 විගණන කමිටු**

2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව විගණන කමිටුව මඟින් තම නිරීක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩල වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර, විගණන කමිටුවේ පහත සඳහන් කරුණු විෂය පථයට අදාල කර නොතිබුණි.

(අ) අභ්‍යන්තර විගණන ඒකකයේ වගකීම් නිශ්චය කර ගැනීම හා වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනය කිරීම

(ආ) ආයතනය තුල ක්‍රියාත්මක වනු ලබන සියලු ක්‍රියාකාරකම් වලට අදාල අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය හා ඇගයීම් කිරීම

(ඇ) වාර්ෂික වාර්තාවට ඇතුලත් කිරීම සඳහා නිරීක්ෂණයන් ඇතුලත් වාර්තා

(ඈ) රාජ්‍ය ව්‍යාපාර කමිටුවට ඉදිරිපත් කරන ලද යෝජනා / මඟපෙන්වීම් පිළිබඳ සමාලෝචනය

(ඉ) අභ්‍යන්තර / බාහිර විගණන වාර්තා කළමනාකරණ ලිපි සම්බන්ධයෙන් සමාලෝචනයක් හා ඉදිරි ක්‍රියා මාර්ග

**5.5 ප්‍රසම්පාදන සැලැස්ම**

සමාලෝචිත වර්ෂය සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණද, අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කර නොතිබුණි.

**5.6 අයවැය ලේඛනමය පාලනය**

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 ප්‍රකාරව, වාර්ෂික අයවැය වාර්තාව වර්ෂයේ අරමුණු ඉටුකර ගැනීම පිණිස උපකරණයක් ලෙස යොදා ගෙන නොතිබීම හේතුවෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් සැසඳීමේදී වියදම් විෂයයන් 07 ක එකතුව රු.3,041,000 ක වියදම් සඳහා ඌන වෙන්කිරීමක් කර ඇති බවත්, වියදම් විෂයයන් 31 ක එකතුව රු. 11,385,000 ක වියදම් සඳහා අධි වෙන් කිරීමක් කර තිබුණි.

(ආ) අයවැයගත ආදායම්, තථ්‍ය ආදායම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 13 කට අදාළව රු.24,622,000 ක ආදායම් ඌනව තක්සේරු කර තිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) පර්යේෂණ ප්‍රදාන උපයෝජනය
(ඇ) මූල්‍ය කළමනාකරණය
(ඈ) සේවක කළමනාකරණය
(ඉ) ප්‍රසම්පාදනය
(ඊ) පුස්තකාල පරිපාලනය
(උ) පාඨමාලා මෙහෙයවීම / කළමනාකරණය